## අමාත්‍ය මණ්ඩල කාර්යාලය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරු පුරප්පාඩු එක (01) ක් පවතින අතර ඒ සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2019.09.12 දිනැති ව නිකුත් කරනු ලැබූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2019 හි ඇමුණුම 02 අනුව සකස් කර ඇති මෙම නිවේදනයේ අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් **2023 ඔක්තෝබර් මස 02 දින** හෝ ඊට පුරම ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වෙත ලැබීමට සැලැස්විය යුතු වේ.

අයදුම්පත යොමු කරන ලිපි කවරයේ හි වම්පස ඉහළ කෙළවරේ "නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර සඳහා ඉල්ලුම්පත" ලෙස සඳහන් කළ යුතුය.

අයදුම්පත් එවිය යුතු ලිපිනය : අමාත්‍ය මණ්ඩලයේ ලේකම්,
අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ලොයිඩ්ස් ගොඩනැගිල්ල,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2050/43 හා 2017-12-22 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට සහ අංක 28/2019 හා 2019-09-12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත් කරනු ලැබේ.

04. එම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ විස්තරාත්මක ලකුණු පටිපාටිය පහත දක්වා ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ලොයිඩ්ස් ගොඩනැගිල්ල,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.

දුරකථන අංකය : 0112329620/0112422438
ෆැක්ස් අංකය : 0112323730
විද්‍යුත් තැපැල් : **info@cabinetoffice.gov.lk**